## පරිසරය

# කඳුළු හෙළන මීගමු කලපුව

මීගමු කලපු සීමාවේ ඉපිද ගොඩබිම් තීරුව සමග සහජීවනයෙන් බැඳී මුළු ඉතිහාසය පුරාම අපේ මීමුත්තන් සමග ගනුදෙනු කළ මීගමු කලපුව නම් වූ සුවිශේෂී සශ්‍රීක පරිසර පද්ධතිය වර්තමානයේ වෙසෙන අපට නම් අතීත සිහිනයක් ම පමණි. කලපු දිය හා එකට බැඳුණු කඩොලාන හෝ ඒ අවට වෙසෙන කුරුල්ලන් දැන් එහි නැත. කඩොලාන පරිසර පද්ධතියේ එහේ මෙහේ පීනා යන මත්ස්‍ය රංචු එහි නැත. අඩු විදහාගෙන එහා මෙහා සැරිසරන ඉස්සන් පොකිරිස්සන් හෝ වෙනත් කිසිදු පණ ඇති ජීවියකුට එහි වෙසෙන්නට ඉඩක් නැත. විෂ වලින් සපිරි රසායනික ද්‍රව්‍යයන් සහ කළු ම කළු දැවිතෙලෙන් මෙන් ම කැලිකසළ වලින් පිරුණු ජලාශයක ජීවීන් වෙසෙන්නේ කෙසේ ද? එසේ නම් ඒ අවට වෙසෙන ධීවරයන්ගේ ඉරණම කෙබඳු විය හැකි ද?

මේ ගැටලු නිරාකරණය කර ගැනීමට නම් මීගමු කලපුව වටා ගෙතුණු අනුවේදනීය කතා පුවත හාරා අවුස්සා බැලිය යුතු ම ය.

මීගමු කලපුව දෙස අතීත සංසිද්ධීන් ඔස්සේ බලන කල විශාල පිරිසකට සම්පත් ලබා දුන් උසස් මට්ටමේ ජෛව විවිධ තත්වයක පැවති සරු ජලාශයකි.

මීගමු නගරය හා ඒ අවට ගම්මාන නාගරීකරණය වීමත් සමගම කලපුව දක්වා වැවී තිබෙන පුළුල් ස්වභාවික ඇළ මාර්ග පටුවීමට



පටන්ගෙන ඇති අතර ඒවා අපිරිසිදු වීමට ද පටන්ගෙන ඇත.

මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ වෙළඳ කලාපය ඔස්සේ විවිධ කර්මාන්ත ශාලා ඉදිවීමත් සමගම හිතුවක්කාර ලෙස ක්‍රියා කරමින් අනේකවිධ අපද්‍රව්‍ය හා කාර්මික අතුරුඵල ලෙස එළිදක්වන රසායනික ද්‍රව්‍ය ඒ අවට්න් ගලාබසින ඇළ මාර්ගවලට මුදා හැරීම යි.

එසේ ම නාගරීකරණය වීමත් සමග ම පිරී ඉතිරී යන්නට වූ ජනතාව ඇළ මාර්ග හා කලපු ඉවුර අනවසරයෙන් ගොඩ කරමින් ඉදිකිරීම් කිරීම නිසා කලපුව ප්‍රමාණයෙන් කුඩා වන්නට පටන්ගෙන තිබේ.

මිනිසා මෙසේ විවිධ මං ඔස්සේ අනන්තයට ම දූෂණය කළ මීගමු කලපුව දැන් මීගමු කලාපය පමණක් නොව ඒ අවට ප්‍රදේශ ගණනාවකට ම දැවැන්ත පරිසර තර්ජනයක් වීමට පටන් ගෙන තිබේ. එසේ ම ඌරු කොටු සහ මළ මුත්‍ර අපවහන කානු අතර දවස් ගෙවනවුන්ගේ ජීවිත කතාව කෙසේ අමතක කරමු ද?

කලපුවට මළ මුත්‍ර අපවහන පද්ධතිය විවර කර තිබෙන්නේ ඊට ටිකක් එහායින් කෑම කන උයන පිහන වළං පිඟන් සේදීමත් කුඩා ළමුන් එතැන ම බැස පීනා නෑමත් මීගමු කලපුවේ සුලබ දසුනකි. මේ නිසා ශරීර සෞඛ්‍යයට එල්ල වන තර්ජන ගැන කාට කිව හැකි ද?

මේ අවාසනාවන්ත තත්ත්වයට වැඩියෙන් ම පත්ව ඇත්තේ මීගමු කලපුව මැද දූපත්වල වෙසෙන අනවසර පදිංචිකරුවන් අපට දැක ගත හැකි ය. මේ පසුබිම තුළ අප අත්දුටු සුවිශේෂ ම කරුණු වන්නේ, මේ පරිසර දූෂණයෙන් පීඩා විඳින බොහෝ දෙනාට ඒ පිළිබඳව කිසිදු හැඟීමක් හෝ අවබෝධයක් නොමැති බව පෙනී යාම යි.

එබැවින් ඔවුහු තව තවත් දූෂිත පරිසරයේ ම කොටස්කරුවන් වෙමින් නොපැහැදිලි අඳුරු අනන්තයක් කරා තල්ලු වෙමින් සිටින බව පැහැදිලි ය. ඊට බලපා ඇති ආර්ථික දේශපාලනය සහ සාමාජික මූලයන් විශ්ලේෂණය කරමින් ඔවුන් යා යුතු ඉසව්ව පෙන්වා දීමට ජා - ඇල ප්‍රාදේශීය සභාව, මීගමුව නගර සභාව, වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මැදිහත් වීම ඔවුන්ට ලැබුණු භාග්‍යයක් විය හැකි ය. මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරමින් වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ අනිල් ප්‍රේමරත්න මහතා මෙසේ කියා සිටියේ ය.

පවුල් 3000 කට පමණ ජීවිකාව සපයන මීගමු කලපුවත්, අනාගතය සඳහා සුරකින රජයේ පැත්තෙනුත් නිශ්චිත සැලසුම් තිබෙන බව යි.

එහි ඉතිහාසය කෙටියෙන් කිවහොත්,

*1989 දී මුතුරාජවෙල වගුර සම්පූර්ණයෙන් ම පුරවා සංවර්ධනය කිරීමට යෝජනා වී තිබුණා.

*එයට විරුද්ධ වී 1991 මුතුරාජවෙල වගුර හා මීගමු කලපුව කළමනාකරණයට මනා සැලැස්මක් බිහි වුණා.

*ඒ කාලේ ම බිහිවූ තෙත් බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය (නෙදර්ලන්ත ආධාර ඇතිව, මධ්‍යම පරිසර අධිකාරිය යටතේ) මගින් මුතුරාජවෙල සහ මීගමු කලපුව සඳහා සංරක්ෂණ කළමනාකරණ සැලැස්මක් 1995 දී බිහි වුණා.

*මේ සැලසුම් දෙකට ම කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණා.

*1996 දී මීගමු කලපුව ලංකාවේ පළවෙනි ධීවර කළමනාකරණ ප්‍රදේශය බවට පත් වුණා.

එසේ ම සැලසුම් තිබුණු පලියට ඒවා ක්‍රියාත්මක වන්නේ නැත්නම් ඵලක් නැති බව ද ඒ මහතා පැවසී ය.

**ඉන්දික කුඩාහෙට්ටි**

ඡායාරූප - **සමන් ශ්‍රී වෙදගේ**



